# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

මුදිත එස් පරණමාන,
අංක 327/9, ඉදිගහදෙණිය,
පැලැන්වත්ත,
පන්නිපිටිය.

**<u>අභියාචක</u>**

**අභියාචනා අංකය : 244/2021** **එදිරිව**

සමාජ සේවා දෙපාතර්මේන්තුව,
2 වන මහල, සෙත්සිරිපාය අදියර-11,
බත්තරමුල්ල.

**<u>පොදු අධිකාරිය</u>**

**ඉදිරිපිටදී** : 1. විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවධර්න - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක නැත.
පොදු අධිකාරිය වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂක - පාලන ගයනි සමරවික්‍රම මිය (තොරතුරු නිලධාරි) පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - 2021.08.06
පොදු අධිකාරිය - 2021.01.15, 2021.08.06

**විභාග කළ දිනය** : 2022.03.02, 2022.05.31

**තීරණය කළ දිනය** : 2022.05.31

**<u>කොමිෂන් සභාවේ තීරණය :</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2020.09.23 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*"2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ ප්‍රකාර 1 වන කොටසේ 13 (ඊ) වැඩිහිටි තැනැත්තන් පිලිබඳ නිවැරදි සහ යතාවත් කරන ලද සංඛ්‍යාලේඛන පවත්වා ගෙන යාමට අනුව,*

1. *කැස්බෑව ප්‍රාදේශීය බල ප්‍රදේශයේ ඇති සියලුම වැඩිහිටි සහ ළමා නිවාස, වැඩිහිටි දිවා සුරකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව, ලිපිනයන් සහ නේවාසිකයන්ගේ තොරතුරු (වයස් බාණ්ඩ/ගැහැණු/පිරිමි සංඛ්‍යාව)*
2. *වැඩිහිටි සහ ළමා නිවාස සමාජ සේවා අමාත්‍යාංශයේ අනු දැනුමකින් තොරව වෙනත් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක ලියාපදිංචි කිරීමට හැකියාවක් ඇත්ද?*
3. *නේවාසිකයන් බඳවා ගැනීමේදී ක්‍රියාත්මක වන ක්‍රියා පටිපාටිය හා නිවාස වල ගුණාත්මකභාවය නියාමනය වන ආකාරය (ප්‍රමිතිය)*
4. *මෙම වැඩිහිටි සහ ළමා නිවාස වල රැඳවියන් හට යම්කිසි දුක්ගැනවිල්ලක් යෝජනාවක් රහස්‍යභාවය රැකෙන පරිදි රැස් කිරීමේ සහ ඒවාට විසඳුම් දීමේ නිශ්චිත යාන්ත්‍රණයක් පවතීද?*

*ඉහත කරුණු සතර සඳහා සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් "*

සමාජ සේවා දෙපාතර්මේන්තුවේ තොරතුරු නිලධාරී විසින්, අභියාචකටද පිටපත් සහිතව 2020.10.08 දිනැතිව ලිපියක් මගින් *"එම අයදුම්පත මගින් විමසා ඇති තොරතුරු ලබා දීම සඳහා එය මේ සමග අමුණා එවමි"* යනුවෙන් අධ්‍යක්ෂ, වැඩිහිටි මහ ලේකම් කායර්ාලය, අධ්‍යක්ෂ, ළමා ලේකම් කායර්ාලය, පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ, පළාත් සමාජ සේවා දෙපාතර්මේන්තුව, බස්නාහිර පළාත වෙත දන්වා යවා ඇත.

මෙයින් අතෘප්තියට පත් අභියාචක විසින් 2020.10.13 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිලධාරි පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2020.11.09 කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

පොදු අධිකාරිය විසින් 2021.01.15 වන දිනැති ලිපිය මගින් පහත සඳහන් කරුණු කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

*"02. අභියාචක විසින් 2020.09.23 වන දිනැති තොරතුරු ඉල්ලීම මගින් විමසන ලද තොරතුරු අප දෙපාතර්මේන්තුවේ විෂය පථයට අයත් නොවන බැවින් ඊට අදාල තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලමින් ජාතික වැඩිහිටි මහ ලේකම් කායර්ාලය, ළමා ලේකම් කායර්ාලය හා බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාතර්මේන්තුව වෙත 2020.10.08 දිනැතිව අභියාචකටද පිටපතක් සහිතව ලිපි යොමු කරන ලදී.*

*03. එහිදී ජාතික වැඩිහිටි මහ ලේකම් කායර්ාලය වෙතින් 2020.10.14 දිනැතිවත්, ළමා ලේකම් කායර්ාලය වෙතින් 2020.10.20 දිනැතිවත් පිළිතුරු අප වෙත එවා ඇත.*

*04. ඒ අනුව මේ වන විට ලැබී ඇති පිළිතුරුවල පිටපත් ද අමුණා 2021.01.15 දිනැතිව එම්.එස්. පරණමාන මහතා වෙත පිළිතුරු ලිපියක් යොමු කරන ලද අතර එහි පිටපතක් ද මේ සමග ඔබ වෙත කාරුණිකව ඉදිරිපත් කරමි."*

එසේම, පොදු අධිකාරිය විසින්, අභියාචකටද පිටපත් සහිතව, 2021.08.06 වන දිනැති ලිපිය මගින් පහත සඳහන් කරුණු කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

*"................... අදාල තොරතරු සමාජ සේවා දෙපාතර්මේන්තුව සතුව නොපැවති බැවිනුත්, එවකට පැවැති කොවිඩ් 19 වසංගතයේ ව්‍යාප්තියත් සමග ඇතිව තිබූ අබර්‍ුදකාරී තත්ත්වය හේතුවෙනුත් පිළිතුරු කඩිනමින් අදාල තොරතුරු ඉල්ලුම් කළ පාශර්වය වෙත ලබාදීමට නොහැකි වූ බව කාරුණිකව සඳහන් කරමි.*

*04. එසේම මුදිත එස් පරණමාන මහතා විසින් ඉදිරිපත් කළ අභියාචනය සම්බන්ධයෙන් ඔබේ අංක A3213/2020 හා 2020.12.17 දිනැතිව මා වෙත ඉදිරිපත් කළ ලිපියට පිළිතුරු ද මාගේ සමාංක හා 2021.01.15 දිනැතිව ඔබ වෙත යොමු කළ බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි."*

අභියාචක විසින් 2021.08.06 වන දිනැති ලිපිය මගින් පහත සඳහන් කරුණු කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

*"………………….. අදාළ කායර්ාල විසින් සපයා ඇති අංක 1 ට අදාළව දී ඇති තොරතුරු පිළිබඳ නිරවද්‍යතාවය පිළිබඳව සැකයක් ඇත. එයට හේතුවක් ලෙස පිළියන්දල ප්‍රදේශයේ වැඩිහිටි නිවාස 03ක් ලෙස දක්වා ඇතත් උදාහරණයක් ලෙස අමාදහර නමින් නිවාසයක් ප්‍රසිද්ධියේ දැකීමට හැකිවීමයි.*

*එහි 2 වන ප්‍රශ්නයට පිළිතුරු ලෙස වැඩිහිටියන් 5 දෙනෙකුට වැඩියෙන් සිටී නම් ජාතික සභාව යටතේ ක්‍රියා කරන වැඩිහිටි මහ ලේකම් කායර්ාලය යටතේ ලියා පදිංචි විය යුතු බවට 2012.03.16 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ගැසට් පත්‍රයට අනුව සිදුවිය යුතුය. එහෙත් එවැනි ලියාපදිංචියක් වූ බවට මා වෙත දැනුම්දීමක් නැත. මේ පිළිබඳව කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කායර්ාලයෙන් විමසූ විට වැඩිහිටි නිවාස 06ක් බල ප්‍රදේශයේ ඇති ලෙස ලිඛිතව දක්වා ඇත. එහෙත් එම ලැයිස්තුවේද අමාදහර නම් වැඩිහිටි නිවාසයක් පිළිබඳව සඳහනක් නැත. ඒ අනුව අංක 02 පිළිතුර ද සාවද්‍ය සේ උපකල්පනය කළ හැක.*

*අංක 3 ට පිළිතුරු දෙස සෑම වැඩිහිටි නිවාසයක් මාස 3ට වරක් ස්ථානීය පරීක්ෂාවක් සිදු කරන බවට දන්වා ඇතත් එම ආයතනය වලින් විමසීමේදී එවැන්නක් නිසි කාලප්‍රාන්ත වලින් සිදු නොවන බවයි. එසේම එහි සඳහන් 1506:2015 ප්‍රමිතියෙන් යුතු නිවාස නිසි බළධාරීන් විසින් අධීක්ෂණය කලේ නම් එහි අධීක්ෂණ වාතර්ා ඉදිරිපත් කිරීමට අදාල අංශ වලට හැකියාව තිබිය යුතුය.*

*අංක 4 මෙම වැඩිහිටි සහ ළමා නිවාස වල රැඳවියන් හට යම්කිසි දුක් ගැනවිල්ලක් යෝජනාවක් රහස්‍යභාවය රැකෙන පරිදි රැස් කිරීමේ සහ ඒවාට විසඳුම් දීමේ නිශ්චිත යාන්ත්‍රණයක් පවතීද?*
*එයට තනි වචනයෙන් "නැත" යන්න ප්‍රකාශයට පත්කර ඇත. මෙම පිළිතුරෙන් රැඳවියන්ගේ ඉරණම සිතාගත හැක."*

**සලකා බැලීම**

ඒ අනුව අද දින සිදු කළ විමසීමේදී හෙළිදරවු වූ කරුණු වලට අනුව, පොදු අධිකාරිය විසින් සිදු කරන ලද තොරතුරු සැපයීමට අදාළව, එකී තොරතුරු සැපයීම පිළිබඳව වෙන් වෙන්ව කරුණු අභියාචකගෙන් විමසීමේදී හෙළිදරවු වූ කරුණු අනුව අභියාචකගේ තොරතුරු ඉල්ලීමට ප්‍රමාණවත් අයුරින් තොරතුරු සැපයීමක් පොදු අධිකාරිය විසින් සිදු කර ඇති බවට පැහැදිලිව පෙනී යයි. එබැවින් ඉදිරිපත් කර ඇති තොරතුරු සැපයීමට අතිරේකව තවත් තොරතුරු ලබා දීමක් තොරතුරු ඉල්ලීම අනුව අවශ්‍ය නොවන බවට පෙනී යන බැවින් මෙම අභියාචනය අවසන් කිරීමට අපි තීරණය කරමු.

මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.